# ජීවිතේ අවසාන කාලය විවේකීව නිහඬ පරිසරයක ගත කරන්න ඕනේ - වික්ටර්



හැඳින්වීම

තොටුපොළ අයිනේ සිට සැන්දෑවරුවේ අපට අත වැනූ ඔහු, රාත්‍රියේ රුකඩ මඩු යාග පොළේදී ඇයට පෙම්බඳිනු අපි ආශ්වාදයෙන් අසා සිටියෙමු. ගී තරු ඉසිරි අහසේ තනිතරුවක් නොවී දශක පහකට ආසන්න කාලයක් පුරා උදා තරුවක් සමව බැබැළුණු ඔහුගේ සුගායනයන් සුවහසක් රසික සවන්පත් සිප සනහා ගලා ගිය අමා දිය දහරක්ම විය. වික්ටර් රත්නායක ලෙසින් ඔබත්, මමත් හඳුනන මේ සංගීතවේදියා ඉකුත් දා නව නිර්මාන ඇතුළත් සීඩී තැටියක් එළිදක්වමින් කලකට පසු සහෘද රසිකයන් ඉදිරියේ පෙනී සිටියේ සිය හැට අටවන ජන්ම දිනය සමරුවේදීය. ඉන් දින කිහියකට පසු තිස් වසරකට ආසන්න කාලයක් අගනුවර ආසන්න කළබලකාරී පරිසරයේ ගෙවූ ජීවිතයට ආයුබෝවන් කී වික්ටර්, ජීවිතයේ සැදෑ සමය හුදකලාව ගතකිරීම සඳහා ඈත එපිට නවාතැනක් වෙත නික්ම ගියේය. මා ඔහු හමුවන්නේ කඩුවෙල නවගමුව ප්‍රදේශයේ පිහිටි වික්ටර්ගේ ඒ නව නවාතැනේදීය.

**මොකක්ද මේ ඇතිවුණ වෙනස කියන තැනින්, එහෙමත් නැතිනම් ජීවිතේ සැදෑ සමයේ ඇයි මේ වගේ තීරණයක් ගත්තේ කියන තැනින් අපේ කතා බහ පටන්ගන්න මම කැමතියි.**

මම මීට අවුරුදු තිස් පහකට විතර ඉස්සෙල්ලා නාවින්නේ පදිංචියට එනකොට එතන තිබුනෙත් මේ වගේ පරිසරයක් තමයි. කන්දෙක අස්සේ කොත්තු රොටී ගහන සද්ද, ටකට ටකට සද්ද තිබුනේ නෑ. දවස තිස්සේ ගැරේජ්වල ටාං ටෝං ගාන සද්ද ඇහුනේ නෑ. කැසට් කඩවල ඝෝෂාවන් තිබුණේ නෑ. මේ වගේම කුරුල්ලන්ගේ සද්දෙ තමයි පරිසරයේ තිබුණේ. මම ඉතා කැමැති ඒ පරිසරය කාලයත් එක්ක අතුරුදහන්වෙලා බොහොම කළබලකාරී ඝෝෂාකාරී පරිසරයක් එහි නිර්මාණය වුණා. අනෙක් පැත්තෙන් මට දැන් වයස හැට අටයි. පුද්ගලයෙක් විදිහට මගෙන් දරුවන්ට පවා ඉෂ්ඨ වෙන්න ඕනේ යුතුකම් ඉටු කරලයි තියෙන්නේ. ඉතිං මම තීරණය කළා කළබලකාරී පරිසරයෙන් අයින්වෙලා ජීවිතේ අවසාන කාලය විවේකීව නිහඬ පරිසරයක ගත කරන්න ඕනේ කියලා.

**ජීවිතේ අවසාන කාලය ගැන තියන තක්සේ-"රුව මොන පදනමකින්ද ගොඩනැගෙන්නේ ?**

මම ජොතිෂ්‍ය වගේ දේවල්වල එල්ඹ ගත්ත කෙනෙක් නෙවෙයි. නමුත් ඒවායේ සත්‍යතාවයක් තියනවා කියලා විශ්වාස කරනවා. ටික කාලෙකට ඉස්සෙල්ලා මට නාඩි වාක්‍යයකරුවෙක් මුණගැහුණා. ඔහු මගේ ජීවිතයේ ඉතාමත් පෞද්ගලික දේවල්පවා බලාගෙන හිටියා වගේ කිව්වා. වයස හැත්තෑවෙදි බරපතල ශල්‍යකර්මයකට මුහුණ දෙන්න වෙනවා, නමුත් ජීවිතය ආරක්ෂා වෙනවා කියලා ඔහු කිව්වා. එතන ඉදලා අවුරුදු පහක් ඉස්සරහට ඒ කියන්නේ අවුරුදු හැත්තෑපහ වෙනකම් විතරයි මගේ අනාගතය ගැන ඔහු කතාකළේ. මම හිතන්නේ දැන් මම ඒ කියපු සීමාවට ඇවිල්ලා. තවම නම් මොකුත් අසනීප සංඥාවක් නෑ. ඒ වුණාට කොයි වෙලේ අපිට මොනව වෙයිද කියලා කියන්න බෑනේ. දැන් බලන්ඩ අබේවර්ධන බාලසූරිය කිසිම දවසක සිගරට් අරක්කු බිව්වෙ නැති අඩුතරමින් සීනි තැවරුන හැන්දකින් හදන තේකක් පවා බිව්වෙ නැති කෙනෙක්. කවුද හිතුවෙ ඔය විදිහේ ඉරණමක් අත්වෙයි කියලා.

**ජීවිතය සම්බන්ධයෙන් වූ මේ වෙනස ඔබේ සංගීත දිවියට මොන විදිහටද බලපාන්නේ ?**

මම නිර්මාණ කාර්යෙන් සම්පූර්ණයෙන් ඉවත්වෙලා නෑ. මගේ අලුත්ම නිර්මාණ ඇතුළත් සීඩී තැටියක් පහුගිය දවස්වල නිර්මාණය කලා. උපන් දින උත්සවය වෙලාවෙ ඒක එළිදැක්වුවා. ඒ වුණාට ඉතිං ඉස්සර ගුවන් විදුලියෙන් වගේ දැන් තියන එෆ්.එම්. නාලිකා වලින් අපේ ගීත ප්‍රචාරය වෙන්-න් නෑනේ. ඒවා සිද්ධ වෙන්නේ අල්ලසට, පගාවට. මට කිසිම උවමනාවක් නෑ ඒ අය පස්සෙන් ගිහිල්ලා මගේ ගීත ප්‍රචාරය කරගන්න. දැන් තියන සංගීත ප්‍රසංග වලට වුණත් මම බොහොම කලාතුරකින් තමයි සම්බන්ධ වෙන්නේ. ඒවා සිද්ධවෙන හැටියට අපිට සම්බන්ධ වෙන්න සුදුසුත් නෑ. සුදුසු අවස්ථාවක් ලැබුණොත් විතරයි සහභාගී වෙන්නේ. ඒ නිසා අමුතු යමක් සිද්ධවෙන්නේ නෑ. අනිත් පැත්තෙන් ඔය කිසිම දෙයක් නොකර ගෙදරට වෙලා හිටියත් කරදරයක් නැතුව ජීවත්වෙන්ඩ පුළුවන් තත්ත්වයක මම මේ වෙන-කොට ඉන්නවා.

**වර්තමානයේ විද්‍යුත් මාධ්‍ය තුළ නව පරපුරේ සංගීත නිර්මාණ වෙනුවෙන් ලැබී තිබෙන ප්‍රමුඛතාවය ගැන යම් ප්‍රතිවිරෝධතාවක්ද ඔබ තුළ පවතින්නේ ?**

නව නිර්මාණ වෙනුවෙන් ප්‍රමුඛතාවයක් ලැබෙන්න නව නිර්මාණ තියෙන්න එපායැ. මොනවද මෑතක ඇවිල්ල තියන නව නිර්මාණ. නිර්මාණ නෙවෙයි වැඩි හරියක්ම තියෙන්නේ ඝෝෂාව. කොහේ හරි බටහිර රටකින් අහුල ගත්ත ගී නිර්මාණවලට සිංහල වචන මිශ්‍ර ඝෝෂාවල් එකතු කරාම ඒක නිර්මාණයක් වෙනවද ? මට ආලෝකෙ ගෙනදේවි සංසාරයේ කියන පැරණි ගීතයට මහා විනාශයක් කරලා ඝෝෂාවල් ඇතුල් කරාම ඒක නව නිර්මාණයක්ද ? තිබුණ නිර්මාණය විනාශ කිරීමක්ද ? මම ගංජා ගහලා එනකොට ඇද උඩ උඩුබැලි අතට දිගාවෙයන් කියලා කෑ ගහලා කරන ප්‍රකාශයක් රූපවාහිනියෙන් විකාශය කරනවා කියන්නේ නව නිර්මාණයකට තැන දීමක්ද? ඔය වගේ දේවල්නේ පැය විසි හතරෙම අහන්න දකින්න ලැබෙන්නේ. නව නිර්මාණ සමඟ හෝ නව නිර්මාණකරුවන් එක්ක මට කිසිම ප්‍රතිවිරෝධතාවක් නෑ. ප්‍රශ්ණෙ තියෙන්නේ එහෙම අය නැති එකයි. මම තාරුණ්‍යයේ සියලූම සංගීත භාවිතය වැරදියි කියනවවත් දොස් නගනවවත් නෙවෙයි. සමහරු ඉන්නවා ඉතාම හොඳ දේවල් කරන්න උත්සාහ ගන්න අය. හැබැයි ඉතා විරලයි.

**ඔබ දකින විදිහට මෑතදී රසවිඳින්නට ලැබුණු හොඳ නිර්මාණ මොනවද ?**

මෑත කාලයේ නම් කිසිම හොඳ නිර්මාණයක් අහන්න ලැබිල නෑ. මම දන්නේ නෑ සමහර වෙලාවට මම ගුවන් විදුලිය රූපවාහිනිය අහන්නේ බලන්නේ නැති නිසාද කියලා. කොහොම වුණත් සංගීත ලෝකයට අලුතෙන් ආව කිසියම් කෙනෙක් වින්දනාත්මක රසාලිප්ත දෙයක් ඉදිරිපත් කලාය කියලා මට නම් ආරංචියක්වත් ලැබිලා නෑ. මාධ්‍ය වලින් සින්දු ඇහෙනවා පෙනෙනවා. නමුත් එහෙම ඇහෙන පෙනෙන දේවල් වලින් නැවතත් අපිට

> "මම ගංජා ගහලා එනකොට ඇද උඩ උඩුබැලි අතට දිගාවෙයන්" කියලා කෑ ගහලා කරන ප්‍රකාශයක් රූපවාහිනියෙන් විකාශය කරනවා කියන්නේ නව නිර්මාණයකට තැන දීමක්ද?

අහන්න දකින්න හිතෙන අපිව ඒ සඳහා පොළඹවාලන නිර්මාණ විදිහට අන්තිමට අපිට ඇහුන නිර්මාන විදිහට මට පේන්නේ ජගත් වික්‍රමසිංහ ජානක වික්‍රමසිංහ වගේ අයගේ ගී තමයි.

**ඇයි ගුවන් විදුලිය, රූපවාහිනය අහන්නේ බලන්නේ නැත්තේ ?**

ගුවන් විදුලියට සවන්දීමේ, රූපවාහිනිය නැරඹීමේ මුඛ්‍ය පරමාර්ථය අධ්‍යාපනික, සංස්කෘතික, ආගමික, සාහිත්‍ය, භාෂාව පිළිබඳ අපි කිසියම් ආකාරයකින් දැනුම්වත් වීමනේ. එහෙම නැත්නම් කිසියම් ආශ්වාදයක් වින්දනයක් ලබාගැනීමනේ. මේ කිසිවක් ලැබෙන්නේ නැත්නම් ඉතිං මොකටද ඒවා පරිහරණය කරන්නේ. ඒ නිසා මම දැන් කාලෙක ඉදලම ගුවන් විදුලිය අහන්නෙත් නෑ. රූපවාහිනිය බලන්නෙත් නෑ. දවසේ පැය විසි හතර පුරාම හොදම ගේය රචනා හොදම ස්වර රචනා හොදම ගායනා වලින් යුත් ගීත ප්‍රචාරය විය යුතුයි කියන දේ නෙවෙයි මම කියන්නේ. යන්තම් ඉවසගෙන අහගන ඉන්න පුළුවන් තත්ත්වයක එක ගීයක් අහන්න පැය කීපයක් මහා ඝෝෂාවකින් කන් හිරිවට්ටා ගන්න වෙනවා කියන එකයි.

**ඔබ හිතන්නේ මෙහි වරද තියෙන්නේ කොතනකද ?**

කිසිම දේකට ප්‍රමිතියක් නැති එක තමයි මූලික හේතුව. අපි ක්ෂේත්‍රයට එන දවස්වල කටහඬ පරීක්ෂණයක් තියලා ඒකෙන් සමත්වෙන අයව තමයි ගායනයට ගත්තේ. ගී පද රචනා සති දෙකකට කලින් භාෂා ප්‍රවීණයන් වෙත ඉදිරිපත් කරලා අනුමැතිය ලබාගත යුතුයි. ඒ කියන්නේ යම් ප්‍රමිති ගත කිරීමක් තිබුණා. ඒ ප්‍රමිතියට පහලින් දෙයකට ගුවන් විදුලියේ අවස්ථාව ලැබුනේ නෑ. නමුත් දැන් තත්ත්වෙ වෙනස්. රටට ඔරොත්තු නොදෙන තරම් එෆ්.එම්. නාලිකා සංඛ්‍යාවක් තියනවා. නමුත් ඒ කිසිම එකක එදා තිබුණ ප්‍රමිතිය නෑ. කුමාරතුංග මුණිදාස එදා කිව්වේ බස නැසුනොත් රස නැසේ කියලා. අඹ ගහ යට හෙවනේ ඉල්ලල අඹ ගන්නේ අඹ ගහ යට හෙවනේ අල්ලලා ඉඹ ගන්නේ කියලා නිකන් රෙද්ද කඩා දැම්මා වගේ අමුවටමනේ කියන්නේ. ඒ ගීත බස නෙවෙයි. මම ගයන ගීතයකත් පෙරළි බස යෙදිලා තියනවා. නමුත් එය යෙදිලා තියන ආකාරයයි මේකයි අතර තියන වෙනස බලන්න. සඳට අහස ආදරේදෝ කියන ගීතයේ අවසානයේ පිරිමියා පද සහනයි කියන-කොට ගැහැණිය සඳ පහනයි කියනවා. පද මවනයි. මද පවනයි කියලා කියනවා. වසර සසනතුරු - සසර වසනතුරු. අම මාදරෙයි කියලා පිරිමියා කියනකොට ගැහැණු ලමයා ඒ පිම්මටම මම ආදරෙයි කියලා කියනවා. ඒ වචනේ ගන්ඩ උපක්‍රමයක් විදිහටයි එතනදි පෙරළි බස යොදාගැනුනේ. එහි අරුමකාරී බවක් සුබවාදී වින්දනයක් ආදිය ගැබ්වෙලා තියනවා.

**වික්ටර් රත්නායක කියන රසිකයාගෙන් එහෙමත් නැත්නම් ප්‍රේක්ෂකයාගෙන් මම ඇහුවොත් මයිකල් ජැක්සන් කියන ගායකයා ගැන මොකක්ද හිතන්නේ කියලා ?**

ඇමරිකාවේ මිනිසුන් මවිත කරවන විදිහේ අරුම පුදුම දේවල් කරන මිනිහෙක්. ජැක්සන් කෑගන්නේ පනුව කැපුව වගේ දඟලන්නේ ඇමරිකාවේ. ඒක ඒ සංස්කෘතියට ගැලපෙනවා. ඇත්තෙන්ම ඇමරිකාව ධන ධාන්‍යයෙන් ආඩ්‍ය රටක් වුණාට කිසිම සංස්කෘතියක් තියන රටක් නෙවෙයිනේ. ඔහුගේ ගායනයක් නෑ. ඔහුගේ තියෙන්නේ ඝෝෂාවක්. විශ්මකාරී මිනිහෙක්. වෙන කවුරුත් නොකරන අසාමාන්‍ය දේවල් කරන කෙනෙක්. දුවනවා කෑගහනවා. ඔළුවෙන් හිටගන්නවා. හරිම විකාරයක්.

**නව තාක්ෂණය, රූප මාධ්‍ය නැතුව ගීතයක් ජනප්‍රිය කරන්න වර්තමානයේ බැහැ කියලා ඇතැම් ගායකයන්ම කියනවා. ඔබ ඒ කාරණය බැහැර කරනවාද ?**

මම හිතන්නේ නොදන්න කම නිසා කියන කතා. අද රූපවාහිනියේ ගයන බොහෝ අය ශබ්දාගාරයකට ගිහිල්ලා කොම්පියුටර් එකේ පිහිටෙන් ගීයක් හදාගෙන පස්සෙ තමයි ඔය අනෙක් සියළු දර්ශණ දාන්නේ. ඒ හුග දෙනෙකුට සජීවීව ගයන්න කියන්න ගායනය පුළුවන්ද කියලා බලන්න. ගායනය කියන්නේ ස්වාධීනව පැවතිය හැකි වෙනමම දෙයක්. අපි හිතමු විදුලිය නැතිව ගියා කියලා. එතකොට ගීතය නැතිවෙනවද ? ඉස්සර මේ මෛක්‍රෆෝන් තිබුනේ නෑ. සජීවීව ගායනය කළා. සජීවීව වාදනය කළා.

**ඔස්ට්‍රේලියාව වගේ රටකින් ප්‍රසංගයකට ආරාධනාවක් ලැබුනොත් ?**

මගේ ස ප්‍රසංගය වගේ එකකදී නම් ගැටළුවක් නෑ. නමුත් වෙනත් විදිහේ එකක් නම් එතනදි මම අර කලින් කියපු කාරණා සළකලා බලලා තමයි ආරාධනය බාරගන්නේ. සුදුසු මට්ටමේ දෙයක් නම් බාරගන්නවා.

ශ්‍රීලාල් සෙනෙවිරත්න.

